කින්නියා නගර සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 19 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 මැයි 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 පෙබරවාරි 25 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ

(අ) 2013 වර්ෂය සඳහා ලැබිය යුතු රු.2,315,550 ක් වූ මුද්දර ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2013 වර්ෂය සඳහා ලැබිය යුතු රු.249,170 ක් වූ උසාවි දඩ ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) ගවමස් කඩ බදු ලෙජරය අනුව 2013 දෙසැම්බර් 31 දිනට ගවමස් කඩ බදු ගිණුමෙහි ශේෂය රු.6,658,914 ක් වුවත් මූල්‍ය ප්‍රකාශයන්හි එය රු.7,230,533 ක් ලෙස සටහන් කර තිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශයන්හි ගවමස් කඩ බදු ගිණුම රු.521,618 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරය අනුව අයකරගත යුතු තක්සේරු බදු ගිණුමෙහි ශේෂය රු.2,026,105 ක් වූ අතර එය මූල්‍ය ප්‍රකාශයන්හි රු.1,821,332 ලෙස ගිණුම් ගතකර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශයන්හි අයකරගත යුතු තක්සේරු බදු රු.204,773 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වාහන ටයර් වාහන ලාම්පු සහ වාහන කුලී වෙනුවෙන් වූ එකතුව රු.34,000 ක් වූ පුනරාවර්තන වියදම් මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

(අ) 2006-2012 කාලපරිච්ඡේදයට අදාළ රු.2,133,204 ක් වූ හිඟ ගවමස් කඩ කුලී සහ රු.4,294,987 ක් වූ හිඟ මාළු වෙළඳපල බදු අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) 2010-2012 කාල පරිච්ඡේදයට අදාළ රු.20,667 ක් වූ හිඟ කුකුළු මස් කඩ බදුකුලිය අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවාසන වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.22,055 ක් වූ සති වෙළඳපොල බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

13.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

------------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 31,403,838 | ඉඩම් හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර සූත්‍ර | 4,638,775 | ස්ථාවර වත්කම් ලේඛණය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 14,216,506 | |
| ලී බඩු සහ සවිකිරීම් | 4,214,257 | |
| කාර්යාල උපකරණ | 285,619 | |
| ණය හිමියෝ | 3,452,568 | ශේෂ සනාථ කිරීම් |
| විවිධ තැන්පතු | 4,582,602 | කාල විශ්ලේෂණ |

1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) නගර සභා ආඥා පනත 255 පරිච්ඡේදය | | |
| i. 177(2) වගන්තිය | - | මහජනයාගේ සාමාන්‍ය දැනගැනීම සඳහා ගිණුම් ප්‍රකාශයන්හි උද්ධෘතයක් 2014 ජුලි 31 දක්වාම ගැසට් නිවේදනයේ පළකර නොතිබුණි. |
| ii. 180(1) වගන්තිය | - | නගර සභාවේ සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂක පරිපාලන වාර්තාව පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| i. මු.රෙ. 700(5) | - | ප්‍රසම්පාදන තීරණ සහ පිළිගත් කොන්ත්‍රාත් ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොකරන ලදී. |
| ii. මු.රෙ. 702(3) | - | කොන්ත්‍රාත් ගිවිසුම් වල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| iii. මු.රෙ. 571(1) | - | කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

1.3.5 ඌණ උපයෝජිත වත්කම්

-----------------------------

වර්ෂ 01-06 දක්වා කාලපරිච්ඡේදයන්හි ඌණ උපයෝජිතව තිබුණු වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් විෂයය | වටිනාකම | ඌණ උපයෝජිත කාලපරිච්ඡේදය |
|---|---|---|
| ට්‍රැක්ටර් | 716,000 | වර්ෂ 04 |
| රෝද 02 ට්‍රැක්ටර් | 34,137 | වර්ෂ 06 |
| ඩිපර් | 5,098,000 | වර්ෂ 02 |
| සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රය | 300,000 | වර්ෂ 03 |
| කැමරා | - | වර්ෂ 01 |
| ඩිජිටල් කැමරා | පරිත්‍යාගයකි | වර්ෂ 02 |
| ෆැක්ස් යන්ත්‍රය | - | වර්ෂ 02 |
| ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර | - | වර්ෂ 01 |
| කොනිකා ඡායා පිටපත් යන්ත්‍ර | - | වර්ෂ 01 |
| වොයිස් රෙකෝඩර් | පරිත්‍යාගයකි | වර්ෂ 02 |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.20,386,740 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,512,834 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.17,873,906 කින් අඩුවී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

-------------------------

2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳව සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i. | තක්සේරු බදු | 398,728 | 127,266 | 271,462 |
| ii. | බදුකුලී | 9,281,500 | 5,171,333 | 4,110,167 |
| iii. | කුලී | 2,076,000 | 82,926 | 1,987,074 |

2.2.2 තක්සේරු බදු සහ කුලී

---------------------------

2006 සිට 2013 දක්වා කාල පරිච්ඡේදයට අදාලව නගර සභා සීමාව තුල ගොඩනැගිලි සහ නිවාස ඉදිකිරීම සහ ඉඩම් වෙනුවෙන් වූ හිඟ හිටි තක්සේරු බදු සහ වරිපණම් බදු මුදල රු.2,026,105 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල අයකරගෙන නොතිබුණි.

2.2.3 විදුලි සංදේශ කුළුණු ගාස්තු

--------------------------------

නගර සභා පරිපාලන බල ප්‍රදේශය තුල විදුලි සංදේශ කුළුණු 08 ක් ස්ථාපනය කර තිබුණු අතර අංක 273 දරන සභා තීරණය ප්‍රකාරව සභාව විසින් ගාස්තු අයකර නොතිබුණි. එම නිසා සභාවට වාර්ෂිකව රු. 24,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 උසාවි දඩ

-------------

2013 දෙසැම්බර් 31 දිනට විවිධ අණපනත් යටතේ සභාවට ලැබිය යුතු උසාවි දඩ ගණනය කර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කර නොතිබුණු අතර එම මුදල් සභාවට අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 9 ක කාල පරිච්ඡේදයක් තුල පරිත්‍යාග ලෙස වාහන 07 ක් ලැබී තිබුණු නමුත් නගර සභාවේ නමින් අයිතිය වෙනස් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම වාහන උපයෝජනයට ගෙනද නොතිබුණි.

(ආ) සභාව නිලධාරීන් 24 ක් සඳහා වූ දායක මුදල් 2006-2008 දක්වා කාල පරිච්ඡේදය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණු බැවින් දායක මුදල් සහ දඩ වශයෙන් එකතුව රු.632,644 ක් වූ මුදලක් ගෙවීමට සභාවට සිදු වී තිබුණි.

(ඇ) 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව වට්ටෝරු භාණ්ඩ සහ පුස්තකාල පොත් එකතුව ඒකක 109 ක ඌනතාවයන් අනාවරණය වී තිබුණි. කෙසේ වුවද මෙම ඌනතාවයන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3.2. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේදී රු.මිලියන 3.75 ක් වූ පිරිවැයකට ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකර තිබුණි. ඝණ අපද්‍රව්‍ය නිසි පරිදි වෙන්කර නොතිබුණු අතර ව්‍යාපෘතිය අත්හැර දමා තිබූ හෙයින් ප්‍රදේශය තුල පාරිසරික දූෂණයක් සිදුවෙමින් තිබුණි.

4. මානව සම්පත් කළමානකරණය

---------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත | තථ්‍ය | අතිරික්තය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| විධායක | 02 | - | - | 02 |
| සභායක | 27 | 24 | - | 13 |
| සුළු සේවක | 80 | 69 | - | 11 |
| වෙනත් | - | 16 | 16 | - |
| එකතුව | 109 | 109 | 16 | 16 |

වර්ෂ 05 කට අධික කාලයක් පුරප්පාඩුව පැවති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 11 ශ්‍රේණියේ 111 පංතියේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 11 ශ්‍රේණියේ 111 පංතියේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

---------------------------------------------

5.1 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 27% සිට 100% දක්වා වූ විචලනයන් පෙන්නුම් කෙරින. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.2 අභ්‍යන්තර විගණනය

--------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 03 සහ 2015 නොවැම්බර් 08 දින දරන චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතුය. කෙසේ වුවද සභාව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

6. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) අයවැය ලේඛනමය පාලනය